# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2220/38 - 2021 මාර්තු මස 23 වැනි අඟහරුවාදා - 2021.03.23

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

සුරාබදු නිවේදනය

සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වැනි අධිකාරය වූ) 32 වැනි වගන්තිය සමග කියවිය යුතු 22 වන වගන්තියෙන් මුදල් විෂයභාර අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 අප්‍රේල් 30 දිනැති අංක 2173/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පහත රීති පළ කරන ලද අංක 02/2020 දරන සුරාබදු නිවේදනය, 2020 සැප්තැම්බර් 10 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ආර්. ආටිගල,<br>
ලේකම්,<br>
මුදල් අමාත්‍යාංශය.

2021 මාර්තු මස 23 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් අමාත්‍යාංශයේ දී ය.

***I උපලේඛනය***

| | *I වැනි තීරුව* *ද්‍රව්‍ය* | *II වැනි තීරුව* *මසකට දේශීයව සපයනු ලබන/ආනයනය කරනු ලබන ලීටර් ප්‍රමාණය* | *III වැනි තීරුව* *බදු ප්‍රමාණය (තොග ලීටරයට රුපියල්)* | |
|---|---|---|---|---|
| | | | *දේශීය සැපයුම* | *ආනයන* |
| 1. | රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මධ්‍යසාර | ලීටර් 10,000 දක්වා | නිදහස් | නිදහස් |
| | | සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය සඳහා ලීටර් 20,000 දක්වා | | |
| | | ලීටර් 10,001 සිට 20,000 දක්වා | | රු. 700 |
| | | ලීටර් 20,000 ට වැඩි | | රු. 1,100 |

*I උපලේඛනය (සම්බන්ධිතයි)*

| | *I වැනි තීරුව* අයිතමය | *II වැනි තීරුව* මසකට දේශීයව සපයනු ලබන/ආනයනය කරනු ලබන ලීටර් ප්‍රමාණය | *III වැනි තීරුව* බදු ප්‍රමාණය (තොග ලීටරයට රුපියල්) | |
|---|---|---|---|---|
| | | | දේශීය සැපයුම | ආනයන |
| 2. | අවසන් නිපැයුම සුරාබදු ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර | ලීටර් 500 දක්වා | නිදහස් | රු. 200 |
| | | ලීටර් 501 සිට 10,000 දක්වා | රු. 100 | රු. 700 |
| | | ලීටර් 10,001 සිට 20,000 දක්වා | රු. 150 | රු. 800 |
| | | ලීටර් 20,000 ට වැඩි | රු. 200 | රු. 1,200 |
| 3. | අවසන් නිපැයුම සුරාබදු ගෙවීමට යටත් නොවන, අපනයන නිපැයුම් නිෂ්පාදන සඳහා යොදා ගන්නා නිෂ්පාදනයන් සහ අපනයන නිපැයුම් නිෂ්පාදන සඳහා හෝ යන්ත්‍රෝපකරණ සේදීම සඳහා වන නිෂ්පාදනයන් සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර | ලීටර් 500 දක්වා | නිදහස් | නිදහස් |
| | | ලීටර් 501 සිට 10,000 දක්වා | රු. 100 | රු. 700 |
| | | ලීටර් 10,001 සිට 20,000 දක්වා | රු. 150 | රු. 800 |
| | | ලීටර් 20,000 ට වැඩි | රු. 200 | රු. 1,200 |
| 4. | අශුද්ධ ඊතයිල් මද්‍යසාර ස්ප්‍රීතු (කාර්මික ස්ප්‍රීතු/ද්‍රාවල ස්ප්‍රීතු සඳහා) | සෑම ලීටරයකටම | රු. 75 | රු. 1,100 |
| 5. | මත්පැන් (මද්‍යසාර) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන ඊතයිල් මද්‍යසාර | සෑම ලීටරයකටම | රු. 10 | රු. 10 |

04 - 532

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.